සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ලාංකීය ස්ත්‍රී එකතුව
சமாதானத்திற்கும் ஜனநாயகத்திற்கான இலங்கைப் பெண்கள்
Sri lankan Women for Peace and Democracy

මාධ්‍ය නිවේදනයයි - 2006 පෙබරවාරි 10 දින

## සුරක්ෂිත සටන් විරාමයක් සහ සාම සාකච්ඡා නැවත ආරම්භ කරන ලෙසට ස්ත්‍රීන්ගෙන් ආයාචනයක්.

## ජනාධිපතිවරයා සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය වෙත ඉදිරිපත් කළ සංදේශය

## සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ස්ත්‍රී ශ්‍රී ලාංකීය ස්ත්‍රී එකතුව විසින්.

අප රටේ ජන වාර්ගික ගැටුමට සාකච්ඡාමය, දේශපාලනමය, විසදුමක් සඳහා කැපවන ශ්‍රී ලාංකික කාන්තාවන් වන අප, රජය සහ එල්.ටි.ටි.ඊ. සංවිධානය අතර පවතින සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක කිරිම සඳහා පවත්වනු ලබන සාකච්ඡා අගය කොට සලකමු.

සන්නද්ධ ගැටුම නිසා පසුගිය දශක දෙකක කාලය තුළ ශ්‍රී ලාංකිකයන් විඳින ලද දුක් ගැහැට පිළිබඳ රජය හා එල්.ටි.ටි.ඊ. සංවිධානයේ අවධානය යොමුකරවීමට අපි කැමැත්තෙමු. විශේෂයෙන්ම යුද්ධයේ දුක් ගැහැට සඳහා උරදී ඇත්තේ කාන්තාවන් හා ළමුන් ය. සටන් විරාම ගිවිසුම බිඳ වැටිම සහ එදිරිවාදිකම් ආරම්භවිම මගින් සිදුවන්නේ නැවතත් ප්‍රචණ්ඩ ක්‍රියා හා විනාශය අප වෙත ලගා විම පමණි. සෑම ජන කොටසකටම අයත් කාන්තාවන් යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් වැන්දඹුවන් බවට පත්ව ඇත. ප්‍රජාව විසිරී උන්හිටි තැන් අහිමි වී ඇත. ශ්‍රී ලාංකිකයන්ට යම් පමණකට සාමාන්‍ය ජන ජිවිතය සාමකාමි පරිසරයක් තුල පවත්වාගෙන යාම සටන් විරාම ගිවිසුම ඉවහල් විය.

සටන් විරාම ගිවිසුම ශක්තිමත් කිරිම සඳහා සාකච්ඡා ආරම්භ කිරිම අත්‍යාවශ්‍ය වේ. මෙම අවස්ථාවේ පවත්වන සාකච්ඡා සාම සාකච්ඡා ආරම්භ කිරිම සඳහා යොමු විය යුතු ය. මූලික කාරණා මේ සාකච්ඡා තුළ ඇතුළත් විය යුතු ය. මේ නිසා පාර්ශව කරුවන්ගෙන් අප ඉල්ලා සිටින්නේ අනාගතය සඳහා ඵලදායි හා අඛණ්ඩව වැඩසටහනක නිරතවිම සඳහා මෙම අවස්ථාව යොදාගන්නා ලෙසයි.

සාමකාමි විසඳුමක් සඳහා දරනු ලබන්නා වු සියලු උත්සාහයන් අප අගය කොට සලකන අතර මෙම විසදුම ජනතාවගේ සියලු අයිතින් ආරක්ෂාකරන ආකාරයට මානව අයිතිවාසිකම් පිළිබඳ රාමුවක් මත පදනම් විය යුතු ය. කල් පවත්නා සාමයක් ලගා කර ගැනිමට නම් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරිමෙන් තොරව එය සිදුකළ නොහැකි බව රජයත් එල්.ටි.ටි සංවිධානයත් කල්පනාවට ගත යුතු ය.

මෙ මගින් මේ අවස්ථාවේ ප්‍රධාන කාරණා ලෙස මතුවි ඇති ප්‍රචණ්ඩත්වය හා ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නවලට විසතිම් සොයා ගැනිමට ඉඩසැලසෙනු ඇත. සාමය යනු සන්නද්ධ ගැටුමක් නිමාවීමක් පමණක් නොවේ. ඊට අමතරව එයින් සියලු පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන හා ප්‍රවර්ධනය වන සාධාරණ සමාජයක් බිහි කිරිම අදහස් කෙරේ.

174, අල්විස් මාවත, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකාව, ■ 174, அல்விஸ் ஒழுங்கை, காசல் வீதி, கொழும்பு 8, இலங்கை,
174, Alwis Avenue, Castle Street, Colombo 8, SRI-LANKA
Telephone : 94-11-2690192, 2690201, 5635900 Fax : 94-11-2690192 E-mail : womedia@sltnet.lk

**සමාජභාවය පිළිබඳ කාරණා සම්බන්ධයෙන් උප කමිටුවක් ගොඩනැගීමට රජය හා එල්.ටී.ටී. සංවිධානය කටයුතු කිරීම අප අගය කරන අතර සටන් විරාම ගිවිසුම පිළිබඳ මේ අවස්ථාවේ පවත්වන සාකච්ඡා වලදී සමාජභාවය පිළිබඳ කාරණා නොසලකා නොහරින ලෙස අප දෙපාර්ශවයෙන්ම ඉල්ලා සිටිමු. එසේම මෙම සාකච්ඡා සඳහා ස්ත්‍රීන් ද සහභාගී කරවීම මගින් ප්‍රායෝගිකව සිවිල් වැසියන් මුහුණ දෙන විවිධ ගැටළු හා අභියෝග සමාජ භාවය පිළිබඳ අර්ථයකින් තේරුම් ගැනීමට උපකාරීවන බව අපි අවධාරණය කරමු.**

**ස්ත්‍රීන් යනු මෙම ගැටුමෙන් හුදෙක් පීඩාවට පත් අය ලෙස පමණක් නොදකින ලෙසත් සාම ක්‍රියාවලිය ගොඩනැංවීම සඳහාත් ඔවුන් ක්‍රියාකාරී සහභාගීවන්නන් ලෙස සලකන ලෙස අපි දෙපාර්ශවයෙන් ම ඉල්ලා සිටිමු. එහෙයින් මේ අවස්ථාවේ පවත්වන සාකච්ඡා වලදීත් ඉදිරියේ දී පවත්වන සාකච්ඡා වලදීත් ස්ත්‍රීන්ගේ ගැටළු සහ සමාජභාවය** පිළිබඳ **කරුණු සැලකිල්ලට ගන්නා ලෙස අපි දෙපාර්ශවයෙන්ම ඉල්ලා සිටිමු.**

**එසේම මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1325 යොජනාව කෙරෙහි ඔබගේ අවධානය යොමුකරවන්න.**

**එසේම පාර්ශවකරුවන් අතර විශ්වාසයත් සහයෝගිතාවයත් ගොඩනැංවීම සඳහාත් ගැටුම්කාරී සාකච්ඡාවලින් බැහැරවන ලෙස දෙපාර්ශවයෙන්ම ඉල්ලා සිටිමු. එසේ නැතහොත් සාකච්ඡා අතර මග නතරවනු ඇති අතර එකගතා ගිවිසුම, වගන්ති, උල්ලංගනය වනු ඇත. ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් සාධාරණ විසඳුමක් සඳහා සාකච්ඡාවල නිරත වෙමින් දශක දෙකක කාලයක් පුරා පැවති ගැටුම අවසන් විමට මෙය අවස්ථාවක් කර ගන්නා ලෙස අපි රජයෙන් ද එල්.ටී.ටී. සංවිධානයෙන් ද ඉල්ලා සිටිමු. එසේම කල්පවත්නා සාමයක් ගොඩ නැංවීමේ අපගේ උත්සාහයට තමන්ගේ ද හඬ එක් කරන ලෙස සාමය සඳහා කැපවන සියලු ශ්‍රී ලාංකිකයින්ගෙන් ද අප ඉල්ලා සිටිමු.**

**සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ස්ත්‍රී එකතුව නියෝජනය කරන සංවිධාන**

1. කාන්තාව හා මාධ්‍ය සාමූහිකය
2. ඉන්ෆෝම් මානව හිමිකම් ප්‍රාලේඛන ආයතනය
3. සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ කාන්තා සන්ධානය
4. සංක්‍රමණික සේවකයින් සඳහා වූ ක්‍රියාකාරී ජාලය (ACTFORM)
5. සෙඩක් ආයතනය
6. නැගෙනහිර එක්සත් කාන්තා සංවිධානය
7. පුබුදුව
8. ගොවි තොරතුරු මධ්‍යස්ථානය, කුරුණෑගල
9. ලක්බිමේ මව්වරු සහ දියණියෝ
10. ගැලවීමේ කන්‍යා සොහොයුරියන් (Salvation Sisters)
11. ඌව වෙල්ලස්ස ගොවි කාන්තා සංවිධානය, බුත්තල
12. නිර්මාණී කාන්තා පදනම
13. ස්ත්‍රී මධ්‍යස්ථානය, ඒකල
14. ඩාබිඳු එකතුව, ජා-ඇල
15. ප්‍රබෝධිනී, ජාතික සාම මන්ඩලය, කොලඹ
16. මුස්ලිම් කාන්තා පර්යේෂණ සහ ක්‍රියාකාරී එකතුව
17. යුද්ධයෙන් පීඩාවට පත් ස්ත්‍රීන්ගේ සම්මේලනය
18. කුරුසයේ කන්‍යා සොහොයුරියන්, කැලණිය (Sisters of the Cross)
19. ප්‍රජා භාරකාර අරමුදල, පුත්තලම (CTF)
20. මානව සංවර්ධන ආයතනය, නුවර
21. නිතිපතා උපකාර කිරීමේ කන්‍යාරාමය (Perpetual Help Convent)
22. කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය, නුවර
23. National Commission for the laity